# අවතරණ අවස්ථා තුළ සංඛ්‍යා භාවිතය පිළිබඳ විශ්වාස

කහඳගමගේ, සන්ධ්‍යා
සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර

**හැඳින්වීම**

අක්ෂර භාවිතය මානවයා අතර පැවතෙන්නටත් පූර්වයේ සිට සංඛ්‍යා භාවිතය ප්‍රමාණාත්මක හැඟීම ඔවුන් සිත් තුළ පැවතිණ. කිසියම් කාර්යයක වඩා නිරවුල් බව උදෙසා සංඛ්‍යා ඉමහත් සේවයක් සපයයි. අපට අතීතයක් හෝ අනාගතයක් පිළිබඳව පැවසිය හැක්කේ ද සංඛ්‍යාත්මක පදනම මතය. 'අදින් වසර 700කට පූර්වයෙන්,' 'ඉදිරියට වසර හැටපහක් ගිය තැන', ආදී වශයෙන් 'අද' යන්න මධ්‍ය ලක්ෂය කරගෙන ඉදිරියට හා පිටුපසට පැවසිය හැකිය. එම කාල වකවානුව පිළිබඳ දළ අවබෝධය ලැබීමට එය ඉවහල් වේ. දවස, සතිය, මාසය, අවුරුද්ද ආදී මේ සියල්ල ක්‍රියාත්මක වන්නේ සංඛ්‍යාත්මක පදනමක පිහිටාය. 'බින්දුව' නම් ශූන්‍ය සංඛ්‍යාවේ සිට ප්‍රමාණාත්මකව ගිණිය නොහැකි 'අනන්තය' දක්වා වන විශාල ප්‍රමාණයේ සංඛ්‍යාව දක්වා විශාල පරතරයක් පවතියි. 'අසූ හාර දහසක ධර්මස්කන්ධය, තිස් තුන් කෝටියක් දෙවි රැකවරණ, දස බිම්බර මාර සෙනග, නහුතයටම නැග්ගා, කොළ කෝටියක් ධනය ඇති වැනි වූ වගන්තිවල දක්වෙන්නේ එවැනි විශාල ප්‍රමාණයේ සංඛ්‍යා පද කිහිපයකි. මෙම සංඛ්‍යා මානව ජීවිතය සමග දැඩි ලෙස බැඳී පවතියි.

මානව ජීවිතයේ ප්‍රථමයෙන්ම හමුවන අවතරණ අවස්ථාව වන්නේ උත්පත්තියයි. උපත කේන්ද්‍ර කරගත් පූර්ව හා පශ්චාත් චාරිත්‍ර රැසක් ලාංකේය ජන සමාජයේ පවතියි. එය මව හා දරුවා යන දෙපැත්තෙන්ම ක්‍රියාත්මක වෙයි. ඒ අනුව ජන විශ්වාස හා චාරිත්‍ර ගොඩ නැගී ඇත්තේ ගර්භනී අවස්ථාව හා පසු ගර්භනී අවස්ථාව වශයෙනි. පසු ගර්භනී අවස්ථාව මව වෙනුවෙන් මෙන්ම දරුවා වෙනුවෙන් ක්‍රියාත්මක වෙයි.ගැබිනි මවක් සත් මස ගෙවන්නේ තරමක චකිතයකිනි. සත් මස ගෙවී අවසන් වන තුරු දරුවා වෙනුවෙන් ඇඳුම් මැසීමට, කොට්ට උර සැකසීමට, වැඩිහිටියෝ අවසර නොදෙති. ගැබිනිය වෙනුවෙන් පිරිත් කියන්නේද සත් මසින් පසුවය. එමෙන්ම කුළුඳුලේ දරුවා ප්‍රසූතය සඳහා ගැබිනි මව ඇගේ මව්ගේ නිවසට පිටත් කර හරිනුයේද සත් මස ගෙවුණු පසුවය. දරුවා බිහි වූ පසු මාස තුනක් ගතවන තුරු උපත් කිල්ල රඳා පවතියි. දරුවා ගෙදරින් දොරට වැඩීමේ සිරිත සිදු වූයේ උපත් කිල්ල නැති වූ ඉක්බිතිවය. දරුවා වෙනුවෙන්

වන භාර භාර ඔප්පු කිරීම් ආදි කටයුතු සඳහා යොමුවන්නේද මෙම කාල සමාව ඉක්ම වූ පසුවය.

සංක්‍රාන්ති අවස්ථාවන් නොවූවත් දරුවා වෙනුවෙන් ජන සමාජය තුළ පිළිගත් සිරිත් විරිත් කිහිපයක්ම දරුවාට අකුරු කියවීම, බත්දීම, දෙරට වැඩීම සහ කණ විදීම යන විවිධ අවස්ථා පාදක කරගෙන ක්‍රියාත්මක වෙයි. මෙකී අවස්ථා ඇසුරේදී භාවිත වන සංඛ්‍යා ඒ හා සම්බන්ධ විශ්වාස ඇදහිලි පිළිබඳව විමසීමට මෙමගින් හැකිවෙයි.

මානව ජීවිතයේ දෙවන සංක්‍රාන්තිය උදවන්නේ මල්වරයත් සමගිනි. මල්වරය ස්ත්‍රී හා පුරුෂ වශයෙන් දෙයාකාරය. මහියංගනයේදී මල්වර යුවතිය ඖෂධ කළ හතකින් නාවනු ලැබෙයි. එම කළ ගෙඩි හතම වස්දෙස් යැවීම සඳහා බිම ගසා බිඳීම සිදුවේ. මල්වර යුවතියට වැට පැන්නීමේ නැකත බලා දෙන්නේද දින හතක් ගෙවී ගිය ඉක්බිතිවය. දහන්දරා හෙවත් අන්තරායකාරී අවස්ථා 10කින් දියණිය බේරාගෙන සමාජයට යහපත් කාන්තාවක් දයාද කිරීමේ කාර්යය තුළදී විවිධ සංඛ්‍යා කෙරෙහි අවධානය යොමු වන අතර එය වඩාත් විනිවිද ලෙස අධ්‍යයනය කෙරේ.

ජීවිතයේ වැදගත් වන තවත් මංසන්ධියකි විවාහය. දූරියක් කාන්තාවක් වශයෙන් දරුවෙක් පුරුෂයෙකු වශයෙනුත් කාර්යය හා වගකීම් දරා ගන්නේ විවාහයත් සමගිනි. විවාහය දීග හා බින්න විවාහ වශයෙන් ක්‍රියාත්මක වෙයි. අතීතයේදී නම් එකගෙයි කෑම නම් චාරිත්‍රය ඔස්සේ බහුපුරුෂ විවාහ ක්‍රමයක් ලංකාවේ ක්‍රියාත්මක වුවත් වර්තමානයේ දක්නට ලැබෙන්නේ ඒක පුරුෂ ඇවැස්ස ඥාතීත්වය මත විවාහය තීරණය කරනු ලැබීමය. පසු කාලීනව ප්‍රේම විවාහ මෙන්ම යෝජිත විවාහද දක්නට ලැබෙයි. විවාහය අවස්ථාව පාදක කරගෙන ඒ ආශ්‍රිත මංගල්‍යය කිහිපයක් පහත දැක්වේ.

- හීන් මංගල්ලෙ
- මහ මංගල්ලෙ
- හේල බැලුම් මංගල්ලෙ
- කද්බැඳි මංගල්ලෙ ඒ අතර වෙයි.

විවාහය සඳහා මනාලියගේ නිවසට යාමට පිරිස තෝරා ගැනීම, මනාලියගේ නිවසට ගෙන යන බුලත් ප්‍රමාණය තීරණය කිරීම, මනාලයාට ප්‍රදර්ශනය වන හත්දෙනා කැරැල්ල, මනාලියගේ කරවටා බැඳෙන මාල හත, අට මඟල සහිත පෝරුව, මනාලයා හෝ මනාලිය වෙනුවෙන් පෙනී සිටින

පිරිස විවාහයෙන් පසු තුන්ද මංගල්ල සඳහා හේල බැලුම ආදී සිරිත් රැසක් ක්‍රියාත්මක වන්නේ සංඛ්‍යා පදනම් කරගෙනය. මෙම චාරිත්‍ර ඇසුරින් සුභාසුභ සංකල්පය බිය හා විශ්වාසය පිළිබඳ සංකල්පය දැඩි ලෙස රඳා පවතියි.

මානවයෙකුට සිය ජීවිතයේ අවසාන වරට හමුවන සංක්‍රාන්ති අවස්ථාව වන්නේ මරණයයි. අවතරණ අවස්ථා අතුරින් සංඛ්‍යා කෙරේ වැඩි බියක් ජනිතව රඳා පවතින්නේ මෙම අවස්ථාව ඇසුරෙනි. එම බිය දෛනික ජීවිතය දක්වා පැතිරී යාමද වැදගත් කරුණකි. මිය ගිය පුද්ගලයා වෙනුවෙන් මෘත කලේබරය ඉදිරියේ කෙරෙන සිරිත් රැසකි. හුණ්ඩුවේ බතක් ඉවීම, තුන් පලකින් ගැට ගසා මිනිය එසවීම, හත් දිනක් දෙර ජනෙල් විවෘතව තැබීම, හත්දෙහෝ දනය, දින හතක් යනතුරු මිය ගිය අයගේ ආත්මය නිවස ආසන්නයේ රැඳී ඇතැයි විශ්වාස කිරීම, වළ වටා තෙවරක් පැදකුණු කිරීම, දෙනේ කෙටීමේදී තුන් වරක් විමසීම ආදී වූ බොහෝ චාරිත්‍ර සංඛ්‍යා පදනම් කරගෙන ගොඩ නැගී ඇත.

මේ සියලුම අවස්ථා සංඛ්‍යා සම්බන්ධ ශාස්ත්‍ර අනුවද ක්‍රියාත්මක වෙයි. දරුවෙක් මෙලෙසට උපත් මොහොතේම ජන්ම වේලාව රැගෙන මතු ජීවිත කාලයටම බලපාන පරිදි ජන්ම කේන්ද්‍රය සකසනු ලැබෙයි. මල්වර වූ දිනය වේලාව පාදක කරගෙන මල්වර නැකත සකස් කෙරෙන අතර මල්වර නැකත අයහපත් වූ කල්හි ඊට පිළියම්ද සිදු කෙරෙයි. විවාහයක් සිදුවන්නේ දෙදෙනෙකුගේ වේලාපත්කඩ පිරික්සා කරන පොරොන්දම් බැලීමකින් අනතුරුව නැකතට මූලිකත්වය ලබා දෙමිනි. මරණයක් වූ පසුද අතීතයේ නැකත් පරික්ෂා කරනු ලැබිණ. එහිදී නැකතෙහි අසුබ ලක්ෂණයක් පැවතුණු විට ඒ සඳහාද විවිධ ප්‍රයෝග යොදනු ලැබිණ. උපතත් සමග ලබා ගන්නා ජන්ම කේන්දර පිටපත ජීවිත කාලය පුරාම විටින් විට පරික්ෂා කිරීමත් එහි අයහපත් බලවේග ඇති කල්හි ඒ වෙනුවෙන් විවිධ ප්‍රතිකර්ම කිරීමත් සඳහා අතීතයේදී මෙන්ම වර්තමානයේදීද මිනිසා පෙළඹී ඇති ආකාරයක් දක්නට ලැබෙයි. මෙකී සියලු කාරණා අනුව සංඛ්‍යාව ජන ජීවිතයේ අවතරණ අවස්ථා ඇසුරේදී ප්‍රබලව බලපාන බව ප්‍රකටය.

**පර්යේෂණ ගැටලුව**

මානව ජීවිතය තුළ සංඛ්‍යා පිළිබඳ සංකල්පය කොතෙක් දුරට කෙසේ බලපා ඇත්දැයි අධ්‍යයනය කිරීම.

**අභිමතාර්ථ**

සංඛ්‍යා පිළිබඳව මානවයා තුළ පවතින විශ්වාසය සහ භාවිතය පිළිබඳව විමසා බැලීම.

**න්‍යායාත්මක අවධානය සහ ආනුභවික මූලාශ්‍රයන්**

සිංහල සමාජයේ අවතරණ අවස්ථා ඇසුරින් සංඛ්‍යාවට හිමි තැන පිළිබඳ අධ්‍යයනය සිදු කෙරෙනුයේ, සමාජ පරිසරය තුළම තැබීමෙනි. එනම් කෘත්‍යාත්මක ස්වරූපය මතය. එහිදී දත්ත එක් රැස් කිරීම, සමාජයේ යෙදෙන ආකාරයෙන් කෘත්‍යාත්මක ක්‍රමවේදය ඔස්සේ අධ්‍යයනය කෙරේ. මේ කරුණු සනාථ කර ගැනීම සඳහා විවිධ ප්‍රදේශ තුළින් තෝරාගත් දත්ත දයක පිරිසක් ද වෙයි.

**ක්‍රමවේදය**

මෙම අධ්‍යයනයේදී ප්‍රධාන වශයෙන් පර්යේෂණ ක්‍රමවේද දෙකක් භාවිත කෙරෙයි.

- ක්ෂේත්‍ර අධ්‍යයන
- ග්‍රන්ථ පරිශීලනය

මින් පළමුවැන්න යටතේ විවිධ ප්‍රදේශන්හිදී නිරීක්ෂණය සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි භාවිතය මගින් දත්ත එක් රැස් කර ගැනීම කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කෙරේ.

දෙවැන්න යටතේ මෙතෙක් ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි ජන ජීවිතය පිළිබඳව ලියැවී ඇති කෘති පරිශීලනයට යොමුවෙයි. ලිඛිතව දක්නට ඇති දත්ත සහ ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් ලබා ගන්නා දත්ත සසඳමින් සංඛ්‍යාව හා මානවයා අතර ඇති සබඳතාව වටහා ගැනීම අපේක්ෂිතය.

**ප්‍රධාන අනාවරණ හා සමාලෝචන**

සංඛ්‍යා හා මානවයා අතර පවතින සබඳතාවය පරීක්ෂා කිරීමේදී ප්‍රබල වශයෙන් උක්තවන කරුණු කිහිපයකි.

උපතේ සිට මරණය දක්වාම යහපත අයහපත උද කළ හැකි සංඛ්‍යා පිළිබඳව මිනිසාගේ විශ්වාසයක් පවතියි. ඔවුන් සිය කටයුතු අරඹන්නේ සුබ අසුබ හොඳින් පිරික්සීමෙන් පසුවය. මෙයද දෙයාකාරයකට ක්‍රියාත්මක වෙයි.

- ශ්‍රැති සූචනයෙන් සංඛ්‍යා පිළිබඳව විශ්වාස කිරීම
- සංඛ්‍යාශ්‍රිත ශාස්ත්‍ර හැදෑරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ලබාගත් සංඛ්‍යා පිළිබඳ විශ්වාස කිරීම.

මින් පළමුවැන්න නම් පාරම්පරික ඥාන සම්ප්‍රේෂණයෙන් උකහා ගන්නා දැනුම අනුව සංඛ්‍යා දෙස බැලීමයි. නවය නපුරු සංඛ්‍යාවක් ලෙස දැකීම නිදසුනකි.

දෙවැන්න අංක විද්‍යාව, ජ්‍යොතිෂය ආදී ශාස්ත්‍රයන් හදරා ලබාගන්නා දැනුම මත ගොඩ නගා ගන්නා සංඛ්‍යා පිළිබඳ විශ්වාසය ඇති කර ගැනීමයි. උදහරණ වශයෙන් මොලොවට බිහි වූ නවජයාගේ ජන්ම වේලාව පරික්ෂා කිරීමෙන් සකසා ගන්නා වේලාපත්කඩය අනුව ඔහු මියෙන තුරාම සුබ අසුබ පරික්ෂා කිරීම දැක්විය හැකිය.

සංඛ්‍යා ආශ්‍රිත ව ගොඩ නැගී ඇති අංක විද්‍යාව, ජ්‍යෝතිෂය වැනි විෂය ක්ෂේත්‍ර විශ්වව්‍යාපී වන අතරම ලාංකේය ජන ජීවිතය තුළද මෙය තදින් බැඳී ඇති බව විද්‍යමානය. අවතරණ අවස්ථාවන් සම්බන්ධයෙන් ප්‍රබලව ඇති ඇතැම් සංඛ්‍යා පිළිබඳව දැඩි බියක් පැවතීමද විශේෂ කරුණකි. අංක 3 එලෙස බිය ගෙන දෙන අංකයකි. මරණය හා සම්බන්ධ අංක තුන කෙරෙහි පවතින අනියත බිය දෛනික ජීවිතයේ විවිධ කරුණු ඔස්සේද අනාවරණය වේ.

නැකත - නක්ෂත්‍රය ද සංඛ්‍යා සමග දැඩි ලෙස බැඳී ඇත. ගණිතයෙහි පවත්නා එකතු කිරීම්, අඩු කිරීම්, වැඩිකිරීම්, සහ බෙදීම් ඔස්සේ යමින් විවිධ කරුණු හෙළි කිරීමේ ක්‍රමවේදයන් මෙම ශාස්ත්‍ර ඔස්සේ සොයාගෙන ඇත. නැකත් සංඛ්‍යාද සෑම අවතරණ අවස්ථාවක් ඇසුරින්ම නිර්මාණය වී ඇත.

අවතරණ අවස්ථාවන් සම්බන්ධ ඇතැම් සංඛ්‍යා ආගමික විශ්වාසය සමග බැඳී පවතියි. ත්‍රිවිධ රත්නය, සත් පත්තිනි පිහිට, තිස්තුන් කෝටියක් දෙවිවරුන්ගේ රැකවරණය පැතීම නිදසුන් කිහිපයකි. මේ සියලු කාරණා අනුව සංඛ්‍යා ජන ජීවිතයේ අවතරණ අවස්ථාවන් සමග ඉතා දැඩි සබඳතාවක් පවතින බවත් එය අතීතයේ, වර්තමානයේ මෙන්ම අනාගතයේදීද ස්ථිතික ව පවත්නා බවත් පැහැදිලි වෙයි.

**කේන්ද්‍රීය වචන :** උපත; මල්වරය; විවාහය; මරණය; සංඛ්‍යාව

**කේන්ද්‍රීය මූලාශ්‍රයෝ**

කහඳගමගේ, සන්ධ්‍යා . (1999) . **ජීවදනයෙන් මතක දනයට.** කොළඹ : ගොඩගේ.

පෙරේරා, යසාංජලී දේවිකා. (2004) . **මල්වර සිරිත .** කොළඹ : ගොඩගේ.

මානෑව, කේ. බී. (2004). **නුවරකලාවියේ ජන මංගල්ල .** කොළඹ: ගොඩගේ.

සේනාරත්න, පී. එම්. (2000) . **ශ්‍රී ලංකාවේ අවමංගල චාරිත්‍ර.** කොළඹ: ගුණසේන.

සේනාරත්න, පී. එම්. **විවාහ මංගල්‍යය චාරිත්‍ර .** කොළඹ: ගුණසේන.